ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය - 2012

-----------------------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

---------------

1.1 තත්ත්වාගණනය කළ මතය

-----------------------------

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

1.2.1 උසස් ගිණුම්කරණ පරිචයන්

------------------------------

පහත නිරීක්ෂණයන් කරණු ලැබේ.

අ) විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යනු ලබන බාහිර පාඨමාලා ව්‍යාපෘති ආදායම් කාලපරිච්ඡේදය අනුව හඳුනා නොගෙන එම ව්‍යාපෘතියේ වර්ෂයේ වියදම වන රු.7,530,559කට සමාන වටිනාකමක් වර්ෂයේ ආදායම් ලෙස ගිණුම් ගතකර තිබුණි. සමාලෝචිත වර්ෂයේ බාහිර පාඨමාලා ආදායම රු.14,886,741ක් වූ අතර විශ්වවිද්‍යාලය විසින් දිගින් දිගටම මෙම ප්‍රතිපත්තිය අනුගමනය කිරීම හේතුවෙන් බාහිර පාඨමාලා ව්‍යාපෘති ආදායම් ගිණුමේ සමුච්චිත ශේෂය රු.19,405,271ක් වී තිබුණි.

ආ) ඉගෙනීම් කටයුතු සඳහා දරන ලද වියදම් හා අනෙකුත් අධ්‍යාපන කටයුතු සඳහා දරන ලද වියදම් ක්‍රමක්ෂය (Amortize) කළ යුතු වුවත් ජංගම නොවන වත්කම් යටතේ ගිණුම් ගත කර තිබුණ රු.1,900,263ක් වූ නිපුණතා සංවර්ධන වියදම ක්‍රමක්ෂය කර නොතිබුණි.

1.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

------------------------

මූල්‍ය ප්‍රකාශනයේ දැක්වෙන සම්පූර්ණයෙන් ක්ෂය වී තවදුරටත් ප්‍රයෝජනයට ගනු ලබන රු.3,967,951ක් වූ වත්කම් 03ක් ප්‍රත්‍යාගණනය කර ගිණුම් ගත කර නොතිබුණි.

### 1.2.3 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ වූ නියැදි පරීක්ෂණයේදී අනාවරණය වූ එකතුව රු.173,002,862ක් වූ ගිණුම්කරණ අඩුපාඩු ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ මහෝපාධ්‍යායයන් වෙත 2013 අප්‍රේල් 19 දිනැති 13:7)(එ) සවිස්තර වාර්තාව මගින් යොමු කරන ලද අතර එම අඩුපාඩු වලින් රු.14,639,113ක් නිවැරදි කර සංශෝධිත මූල්‍ය ප්‍රකාශන 2013 ජූලි 17 දින විගණනයට ඉදිරිපත් කෙරුණි.

### 1.2.4 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

-----------------------------------

2012 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රත් මත රඳවාගැනීම් ශේෂය වූ රු.12,252,176ක් තුළ වර්ෂ දෙකකට වඩා පැවති ශේෂය රු.11,172,763ක් වූ අතර මෙම මුදල තුළ 2005 සිට 2007 දක්වා කොන්ත්‍රාත් දෙකකින් රඳවා ගත් මුදල රු.10,880,640ක් විය. එම කොන්ත්‍රාත් නියමිත කාල වකවානු වලදී ඉටුකර අවසන් වී නොතිබුණි.

### 1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරණු ලැබේ.

අ) විවිධ ණයහිමියන්හි ඇතුළත් රු.483,450ක්වු සේවා තැන්පත් සහ රු.257,040ක්වු ආරක්ෂක තැන්පත් සඳහා ශේෂ තහවුරු කිරීම් හෝ මුදල් ගෙවූ බවට වූ කුවිතාන්සි ඉදිරිපත් නොකෙරුණි.

ආ) මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන රු.142,270,681ක පුනරාවර්තන වියදම් :බාහිර ව්‍යාපෘති වියදම් ඇතුළුව* සඳහා වූ ලෙජර් ගිණුම් විගණනයට ඉදිරිපත් නොවීම නිසා එම වියදම් ගිණුම් ගත කිරීමේ හා වර්ගීකරණය කිරීමේ නිවැරදිතාවය විගණනයේදී තහවුරු කරගැනීමට සාක්ෂි නොවිණි.

## 1.2.6 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| අ) විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහය<br>XXVI පරිච්ඡේදයේ 2.1 ඡේදය | උසස් අධ්‍යාපන ආයතන වලට අයත් සියලුම භාණ්ඩ හා ස්ථාවර වත්කම් පිළිබඳ පත් කරනු ලබන සමීක්ෂණ මණ්ඩලයක් විසින් වාර්ෂිකව හර වැරදි බැලීම් කළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ දී රු.13,434,024ක් වු පුසතකාල පොත් සම්බන්ධයෙන් සමීක්ෂණ සිදුකර තිබුණද අදාල වාර්තා ඉදිරිපත් කර නොතිබුණි. |
| ආ) 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛය | සේවක අර්ථ සාධක අරමුදලට, සේවක භාරකාර අරමුදලට දායක මුදල් ගෙවීමේ දී අධ්‍යයන දීමනාව සැලකිල්ලට ගැනීම හේතුවෙන් 1997 වර්ෂයේ සිට 2011 අගෝස්තු දක්වා රු.4,155,912ක මුදලක් වැඩිපුර ගෙවා තිබුණි. |
| ඇ) 2002 නොවැම්බර් 28 දින හා අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය. | විශ්වවිද්‍යාලයේ පරිගණක උපාංග සම්බන්ධව ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| ඈ) 2012 මැයි 29 දින පැවති 325 වැනි පාලක සභා තීරණය | දේශන සඳහා සියයට 80ට වඩා සහභාගී වූ සිසුන් පමණක් අවසාන විභාගයට පෙනී සිටීම සඳහා පාලක සභාව විසින් අනුමත කර තිබුණි. ඊට පටහැනිව නේවාසික විශ්වවිද්‍යාලයක් වන මෙම විශ්වවිද්‍යාලයේ සිසුන්ගේ පැමිණීම සියයට 40 සීමාව දකවා අඩුකර විභාගයට පෙනී සිටීමට අභියාචනා අධ්‍යයන කමිටුව අවසර ලබා දී තිබියදීත් සියයට 40ක පැමිණීමේ ප්‍රතිශතය නොමැති සිසුන් 07 දෙනෙකු වෙතද විභාගය ලිවීමේ අවසරය ලබා දී තිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ වැඩ කටයුතු වල මූල්‍ය ප්‍රතිඵලය, පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රදානය ගණන් ගැනීමට පෙර රු.129,532,400ක ඌනතාවයක් වූ අතර ඉකුත් වර්ෂය සඳහා වූ ඊට අනුරූප ඌනතාවය රු.154,471,836ක් වුයෙන් ඌනතාවයේ රු.24,939,436ක අඩුවීමක් නිරීක්ෂණය විය. පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු.119,347,880ක් වූ ප්‍රදානය ගණන් ගැනීමෙන් පසුව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.10,184,520ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයෙ ඌනතාවය රු.62,152,897ක් වූයෙන් මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය රු.51,968,377ක් විය. සමාලෝචිත වර්ෂයේ වියදම් සඳහා රජයේ ආධාර රු.27,028,941ක් වැඩියෙන් ලැබීම සහ රජයේ ප්‍රතිපාදන රු.47,534,691කින් ක්‍රමක්ෂය කිරීම මීට පධාන වශයෙන් හේතු වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------

### 3.1 කාර්ය සාධනය

----------------

පහත නිරීක්ෂණයන් කරණු ලැබේ.

අ) ශ්‍රී ලංකාවේ හා විදේශයන්හි බෞද්ධාගම පතුරුවාලීම හා ධර්මදූත කටයුතු පෝෂණය කිරීම සඳහා බෞද්ධ ධර්මය හා විනය පිළිබඳ ශාස්ත්‍රධරයන් පුහුණු කිරීම මූලික අරමුණ වන අතර සමාලෝචිත වර්ෂය සහ පසුගිය වර්ෂ හතරකදී සාමාන්‍ය උපාධි සඳහා අභ්‍යන්තර ශිෂ්‍යයින් ලෙස ඉල්ලුම් කළ හා බඳවා ගත් දේශීය හා විදේශීය ශිෂ්‍ය සංඛ්‍යාව පිළිබඳ සාරාංශයක් පහත දැක්වේ.

| වර්ෂය | ඉල්ලුම් කළ සංඛ්‍යාව | | බඳවා ගත් සංඛ්‍යාව | |
|---|---|---|---|---|
| | දේශීය | විදේශීය | දේශීය | විදේශීය |
| 2008 | 293 | 61 | 109 | 61 |
| 2009 | 196 | 74 | 109 | 74 |
| 2010 | 353 | 45 | 109 | 45 |
| 2011 | 305 | 48 | 110 | 48 |
| 2012 | 379 | 46 | 107 | 36 |

2012/2013 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් බඳවා ගැනීම 2012 නොවැම්බර් 08 දින සිදුකර තිබුණි. මේ හේතුවෙන් 2012 වර්ෂයේ පළමු වසරේ පාඨමාලා 2013 වසරේ ආරම්භ කර තිබුණි.

ආ) විශ්වවිද්‍යාලයේ අරමුණු ඉටුකර ගැනීමට හැකිවන පරිදි ප්‍රායෝගික, ඵලදායී පුහුණු වැඩපිළිවෙලක් සැලසුම් කර විශ්වවිද්‍යාලීය උපාධි විෂයධාරා තුලට ඇතුළත් කර නොතිබුණි. 1984 සිට 2012 දක්වා කාල සීමාව තුල ආචාර්ය, දර්ශනපති, ශාස්ත්‍රපති උපාධි, ඩිප්ලෝමා ආදී විභාග සමත් වූවන් 6283ක් බිහිකර ඇතත් ඉහත අරමුණු කරා ලඟාවීම පිළිබඳව විශ්වවිද්‍යාලය විසින් පසුවිපරම් කර නොතිබුණි.

## 3.2 ශිෂ්‍ය පිරිවැය

---------------

සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යයන කටයුතු සඳහා ශිෂ්‍යයින් 359 ක් වෙනුවෙන් දරන ලද මුළු පුනරාවර්තන වියදම රු.189,805,371ක් වූ අතර ඒක ශිෂ්‍ය පිරිවැය රු.528,706ක් විය. ඉකුත් වර්ෂයේ ශිෂ්‍යයින් 519ක් වෙනුවෙන් දරන ලද මුළු පුනරාවර්තන වියදම රු.167,851,717ක් හා ඒක ශිෂ්‍ය පිරිවැය රු.323,414ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඒක ශිෂ්‍ය පිරිවැය රු.205,292කින් එනම් සියයට 63.48කින් වැඩිවී තිබුණි.

## 3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

----------------------------------

පහත නිරීක්ෂණයන් කරණු ලැබේ.

අ) 2006 අංක 10 දරන දේශිය ආදායම් පනතේ විධිවිධාන සහ 2011 අයවැය මගින් ඊට යෝජිත සංශෝධනයන්ට අනුව රාජ්‍ය ආයතනවල මාසිකව නිත්‍ය සේවා නියුක්ති ලාභ රු.50,000ක් හෝ වර්ෂයකට රු.600,000කට වැඩියෙන් ලබන සේවා නියුක්තිකයින් 2011 වර්ෂයේ අප්‍රේල් 01 සිට උපයන විට ගෙවීමේ ක්‍රමය යටතේ ලියාපදිංචි කර බදු අඩුකර දේශිය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කළ යුතු වුවද 2011 හා 2012 යන වර්ෂවලට අදාල බදු මුදල් අඩුකර දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙත ප්‍රේෂණය කිරීමට කටයුතු කර නොතිබුණි.

ආ) 2011 අප්‍රේල් 7 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 45 ප්‍රකාරව විශ්වවිද්‍යාලය විසින් 2011 වර්ෂය සඳහා නිලධාරීන් 24 දෙනෙකු වෙත පර්යේෂණ දීමනා රු.2,986,800ක් ගෙවා තිබුණි. උක්ත චක්‍රලේඛයේ 4(අ) ඡේදය ප්‍රකාරව 2012 වර්ෂය අවසන් වන විට අදාල කමිටුව වෙත පර්යේෂණ වාර්තා 5ක් ඉදිරිපත් කර තිබුණු අතර එම වගන්තියේ සඳහන් වන අවශ්‍යතාවයන් ඉටු කල බවට සාක්ෂි නොතිබු නිලධාරීන් 24 දෙනෙකු වෙත රු.3,371,085 ක පර්යේෂණ දීමනා 2012 වර්ෂය වෙනුවෙන් ගෙවා තිබුණි.

3.4 **මෙහෙයුම් අකාර්යක්ෂමතා**

-----------------------------

බෞද්ධ අධ්‍යනයට හා පාලි භාෂාවට පමණක් සීමා වූ පර්යේෂණ වලට ආධාර කිරීම සඳහා පිහිටුවා තිබූ ජ්යුන් බෞද්ධ පර්යේෂණ හා ප්‍රකාශන අරමුදල 2006 න් පසුව අදාල අරමුණ ඉටුකරගැනීම සඳහා යොදවා ගෙන නොතිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයේදී අරමුදලේ ශේෂය රු.1,824,042ක් විය.

3.5 **අරමුදල් ඌන උපයෝජනය**

-----------------------------

පහත නිරීක්ෂණයන් කරණු ලැබේ.

අ) ශිෂ්‍යත්ව, ත්‍යාග හා වෙනත් අරමුදල් වලින් අරමුණු ඉටුකර ගැනීමට ප්‍රමාණවත් මුදලක් ඉතිරි කිරීමේ ගිණුම්වල රඳවා ගෙන ඉතිරිය ආයෝජනය කර ආදායමක් උපදවා ගැනීමට කළමනාකරණය කටයුතු කළ යුතු වුවත් ඉහත බැංකු ගිණුම්වල වර්ෂය අවසානයේ පැවති රු.5,655,459 ක් වන ශේෂය ඵලදායී ලෙස යොදවා නොතිබුණි.

ආ) 2011 හා 2012 අධ්‍යයන වර්ෂවල විභාග ප්‍රතිඵල සැලසුම් කළ පරිදි නිකුත් නොකිරීම නිසා ත්‍යාග හා ශිෂ්‍යත්ව පිරිනැමීමේ දී මාස 6 සිට මාස 18 දක්වා කාල ප්‍රමාදයක් සිදු වී තිබුණි.

3.6 **නිශ්ක්‍රීය ඌන උපයෝජිත වත්කම්**

-----------------------------------

2004 වර්ෂයේ සිට රු.මිලියන 512ක් වැය කර සියළු පහසුකම් සහිතව නවීකරණය කරන ලද ගොඩනැගිලි ඇතුළු යටිතල පහසුකම් වැඩිදියුණු කර තිබුණද ඊට සාපේක්ෂව සිසුන් වැඩි සංඛ්‍යාවක් බඳවා ගැනීම කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. 2012 වර්ෂයේදී සිසුන් 379 දෙනෙකු ඉල්ලුම් කළද බඳවා ගෙන තිබුණේ සිසුන් 107 දෙනෙකු පමණි.

4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

-------------------------------------

4.1 සංයුක්ත සැලැස්ම

--------------------

සංයුක්ත සැලැස්මේ පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

අ) ගොඩනැගිලි ඉදිකිරීම

-------------------------

සංයුක්ත සැලැස්මෙන් 2012 වර්ෂයේ ඉටුකර ගැනීමට යෝජිත ගොඩනැගිලි ඉදිකිරීමේ ව්‍යාපෘති සඳහා වර්ෂයේ මූලධන ඇස්තමේන්තුවෙන් රු.මිලියන 234.5 ක් භාණ්ඩාගාරය විසින් වෙන් කර තිබුණද විශ්වවිද්‍යාලයට එය ඉටුකරගත නොහැකි වී තිබුණි. එම කටයුතු ඉදිරි වර්ෂයන්හීදී හෝ ඉටුකර ගැනීමට අවශ්‍ය පරිදි 2012-2016 සංයුක්ත සැලැස්ම යාවත්කාලීන කිරීමට කටයුතු කර නොතිබුණි.

ආ) පුස්තකාල කටයුතු

---------------------

2012-2016 සංයුක්ත සැලැස්මෙහි 2012 වර්ෂයේදී පුස්තකාලයට අදාළව ඉටුකර ගැනීමට අපේක්ෂා කළ ක්‍රියාකාරකම් හි ශාස්ත්‍රීය ලිපි සංග්‍රහයක් සකස් කිරීම, ප්‍රතිපත්ති ප්‍රකාශනයක් සකස් කිරීම සහ අන්තර්ජාල සේවා පුළුල් කිරීමද සිදුකර නොතිබුණි.

4.2 අයවැය පාලනය

------------------

ඉඩම් හා ගොඩනැගිලි අත්පත් කර ගැනීම සඳහා රු.101,920,000ක් අයවැයෙන් වෙන්කල ද එම කාර්යයන් යුහුසුළුව ක්‍රියාත්මක නොකිරීම හේතුවෙන් රු.50,000,000ක් මු.රෙ.66 මගින් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් මාරුකර ගෙන තිබුණි.

## 5. පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලයේ මහෝපාධ්‍යායයන් වහන්සේගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

අ) ස්ථාවර වත්කම්

ආ) පුස්තකාල කළමනාකරණය

ඇ) ඉදිකිරීම්

ඈ) මානව සම්පත් කළමනාකරණය

ඉ) බාහිර ව්‍යාපෘති වලට අදාල ගිණුම්කරණය

ඊ) වාහන පාලනය